077

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - 1 වන මට්ටම
අවසාන පරීක්ෂණය
අධ්‍යයන වර්ෂය - 2007
භූගෝල විද්‍යාව - SSF 1302

කාලය : පැය තුනයි (03)

දිනය : 2007.10.09 වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

සෑම කොටසකින්ම අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරාගත යුතුය.

සිතියම් ලකුණු කිරීම සඳහා ලෝක සිතියමක් සපයා ඇත.

සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

1. පහත සඳහන් දෑ ලෝක සිතියමක ලකුණු කොට නම් කරන්න.
   - (අ) උත්තරාර්ධ ගෝලයේ ප්‍රධාන ධීවර බිම් හතරක්.
   - (ආ) ආසියාවේ ඛනිජ තෙල් ලබාගන්නා වැදගත් ප්‍රදේශ හතරක්.
   - (ඇ) ජනගහනයෙන් 50% කට වැඩි ජනතාවක් නාගරික ප්‍රදේශවල වසන, බටහිර ආසියාවේ රටවල් පහක්.
   - (ඈ) නවසීලන්තය, දකුණු අප්‍රිකාව, ආර්ජන්ටිනාව, මැඩගස්කරය, ඇමසන් ගංගාව.

(ලකුණු 20)

## පළමුවන කොටස

2. (අ) 'සංචාරක ව්‍යාපාර' කර්මාන්තයේ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (ආ) 'ශබ්දවාදය' යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

3. (අ) පවත්වාගත හැකි ස්වාභාවික සම්පත් මොනවාද? (ලකුණු 05)
   (ආ) පවත්වාගත හැකි සම්පත් අනාගත පරිභෝජනය සඳහා කල්තබාගැනීමට දියුණුවන රටවල් යොදාගන්නා තාක්ෂණික ක්‍රම මොනවාද? (ලකුණු 15)

4. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක් (02) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   - (අ) කිරිපට්ටි පාලනය
   - (ආ) ක්ෂය වන සම්පත්
   - (ඇ) ඛනිජ තෙල් නිෂ්පාදනය
   - (ඈ) සල ගොවිතැන

(ලකුණු 20)

## දෙවන කොටස

5. නිවර්තන ප්‍රදේශවල පාරිභෝගික කෘෂිකර්මයේ ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

6. සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයට වතු කෘෂිකර්මයෙහි ඇති, අති විශේෂත්වය පැහැදිලි කරන්න. (ලකුණු 20)

7. (අ) මධ්‍යධරණී දේශගුණය ඇති ප්‍රදේශ 4ක් නම් කරන්න. (ලකුණු 08)
   (ආ) මධ්‍යධරණී දේශගුණයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 12)

## තෙවන කොටස

8. ව්‍යාපාරික තිරිඟු වගාව සඳහා යොදාගන්නා නවීන ක්‍රම සුදුසු උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

9. මහා මාර්ග ප්‍රවාහනය හා දුම්රිය මාර්ග ප්‍රවාහනයේ අරමුණු හා මූලික ලක්ෂණවල සමාන හා අසමානතා දක්වන්න. (ලකුණු 20)

10. ස්වභාවික පරිසරය ජනගහන ව්‍යාප්ති රටාවට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

***** සියළුම හිමිකම් ඇවිරිණි *****